ප්‍රශංසා එකතු සුපවත
2018 ජනවාරි මස 07 වන දින සිට ජනවාරි මස 14 වන දින දක්වා
ඇදහිල්ල ශුද්ධාත්ම දීමනාවකි

01. ආරම්භක ප්‍රශංසාව - පුබුදු ගී අංක 07 "සුදත් සුරිඳුනේ....."
ප්‍රශංසාවට හැඳින්වීම :

**"දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක්ද කිවහොත් ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් වුවද, ලෝකයට දෙවා වදාළ සේක. එසේ කළේ ඔවුන් වහන්සේ කෙරෙහි අදහන සියළු දෙනාම විනාශ නොවී සදාතන ජීවිතය ලබන පිණිසය."** (ශු.ජොහාන් 3:16)

ප්‍රසාද ස්නාපනය ලබා දේව දරුකම උරුම කරගත් අප ඔවුන් වහන්සේ අදහන්නන්ය. දෙවියන් වහන්සේගේ ප්‍රේමය මෙතරම්ම බලගතුව අත්දකින්නට භාග්‍ය ලැබූවන් ලෙස මුළු හදවතින්ම ඔවුන් වහන්සේට ප්‍රශංසා කරමු. අප කෙරෙහි ඔවුන් වහන්සේගේ ප්‍රේමය ගැන උදන් අනමු. ප්‍රීති ඝෝෂා පවත්වමු.

පුබුදු ගී අංක 134 "පරම අපරිමිත ..... "

02. දවසේ සුපුවත : ඇදහිල්ල ශුද්ධාත්ම දීමනාවක් ලෙස

ඇදහිල්ල ක්‍රියාත්මක වන්නේ දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර සම්බන්ධතාවයේ පදනම මතය. ඇදහිල්ල දීමනාවකි, තිළිණයකි. එය මනුෂ්‍ය උත්සාහයෙන් ලබා ගත නොහැකිය. දෙවියන් වහන්සේ විසින්ම දෙන විශේෂ වරමකි. විශ්වාසයේ දීමනාව අපට ලැබෙන්නේ ප්‍රසාද ස්නාපනය තුළින්ය. ප්‍රසාද ස්නාපනය දානය කිරීමේදී එම පිළිවෙත තුළ පූජාප්‍රසාදි තුමා ඔබ දරුවා වෙනුවෙන් දෙවියන් වහන්සේගෙන් ශුද්ධවූ සභාව වෙනුවෙන් ඉල්ලන්නේ කුමක්දැයි දෙමව්පියන්ගෙන් අසන ප්‍රශ්නයට ඔවුන් දෙන පිළිතුර ප්‍රසාද ස්නාපනය දානය කරන්නට කියාය. පියතුමා යාච්ඤාවෙන් මෙලෙස ප්‍රකාශ කරයි. 'ඔබගේ දරුවන් හට ප්‍රසාද ස්නාපනය දෙන මෙන් ඔබ ඉල්ලා සිටින්නෙහිය. එමගින් ඔබ ඔවුන් දේව විශ්වාසයෙහි පුරුදු පුහුණු කිරීමේ වගකීම බාර ගන්නහුය.' එලෙසම වැඩිහිටි ප්‍රසාද ස්නාපනයේදි ද ප්‍රසාද ස්නාපනය ලබන්නා විශ්වාසය ඉල්ලා සිටී. මින් පැහැදිලි වන්නේ විශ්වාසයේ දීමනාව අපට ලැබෙන්නේ ප්‍රසාද ස්නාපනය ලැබීමේදීම බවය.

ශුද්ධවූ පාවුළු තුමා කොරින්ති වරුන්ගේ පළමු ලිපියෙහි මෙලෙස සඳහන් කරයි.

**"අන් කෙනෙකුට ආත්මයාණන් තුළ විශ්වාසයද"** (1කොරෙන්ති 12:9)

මෙම ප්‍රකාශනය තුළ දෙවියන් වහන්සේ තෝරා ගත් අය සඳහා ප්‍රබල ක්‍රියා හා ලකුණු මගින් දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමට ලැබෙන වරමක් ලෙස විශ්වාසයේ දීමනාව පෙන්වා දී ඇත. එම නිසා විශ්වාසය දීමනාවකි. විශ්වාසයේ දීමනාව ලැබූ පුද්ගලයා දෙවියන් වහන්සේගේ ප්‍රේමය අතී ප්‍රබල ලෙස අත්දකී.

03. අප දෙසට (කණ්ඩායම් තුළ බෙදා ගන්න)

* ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ අප ලැබූ විශ්වාසයේ දීමනාව එදිනෙදා ජීවිතය තුළ කෙලෙස අත්දකින්නේද?
* අදහන්නා තුළින් දෙවියන් වහන්සේ සිදු කරන ප්‍රබල ක්‍රියා අත්දකින්නට අප සූදානම්ද?
* විශ්වාසයේ දීමනාව අත්දකිමින් ක්‍රිස්තු ශ්‍රාවකත්වයට සාක්ෂි දරන්නට අප කොතෙක් නම් පියවර ගෙන තිබේද?

05. අවසාන ප්‍රශංසාව - පුබුදු ගී අංක 54 "ජීවනයේ ස්වාමිනි...."

******************************

ප්‍රශංසා එකතු සුපවත
2018 ජනවාරි මස 15 වන දින සිට ජනවාරි මස 21වන දින දක්වා
විශ්වාසාලෝකය දෙවියන් වහන්සේගෙන් අප ලබා ඇති නව තිළිණයකි

01. ප්‍රශංසාව සඳහා :

(අ) කිතුනු ශ්‍රාවකයා දිනපතා ජීවිතයේදී තමාට මුහුණ පන්නට සිදුවන ප්‍රසන්න නොවන සිද්ධීන් පවා විශ්වාසාලෝකයෙන් දකිමින් දෙවිඳුන්ට තුති පැසසුම් පුද කරයි. මන්ද ඔවුන් වහන්සේ තමා සමඟ සිටින බව තරයේ විශ්වාස කරමින් බාහිර වශයෙන් පෙනෙන දෙයට වඩා නොපෙනෙන යහපත ඔහුට පෙනෙන බැවිනි. තමාගේ මුළු බලාපොරොත්තුවම දෙවිඳුන් වෙත තබා යහපත කරයි.

(ආ) * යෙසායා 43:3 මෙනෙහි කරමින් ප්‍රශංසාවට ඇතුළු වෙමු.
* මන්ද මම නුඹලාගේ දෙවිඳාණෝය. නුඹලාගේ ගැළවුම්කාරයාණෝය. ඉශ්රායෙල් වරුන්ගේ සුවිශුද්ධ තැනැන්වහන්සේය.
* පුබුදු ගී අංක 18 "මගෙ ජීවනයම ඔබ වේ...."

02. පසුගිය සතියේ අත්දැකීම් බෙදා ගනිමින් එම අත්දැකීම් මුල් කරගෙන ප්‍රශංසා කරමු.

03. සතියේ සුපුවත :

* ලෝකය මැවීමේදී පළමු පමැවීම වන ආලෝකය මගින්, ලෝකයට අළුත් උපතක් ලැබුනා සේම කිතුනු ජීවිතය මගින් අළුත් උපතක් ලැබීමට හේතු වූයේ විශ්වාසාලෝකයයි.
* ක්‍රිස්තුන් වහන්සේව හමුවීමේ අත්දැකීමත් සමඟම විශ්වාසයේ තෑග්ග හිමි කරගත් ශු.පාවුළු තුමා, විශ්වාසයේ එළියෙන් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ දැනගැන්ම මෙන්ම පෞද්ගලික සම්බන්ධතාවය වැඩි වර්ධනය කර ගත්තේය.
* මෙහි පහත දැක්වෙන ශු.ලියවිලි පාඨය කියවා විශ්වාසාලෝකය කරණ කොට ගෙන ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳව ශු පාවුළු තුමා අත්දුටු අයුරු සාකච්ඡා කොට බෙදා ගන්න.
* (කොලොස්සි 1:24-27)

**"ඔබ උදෙසා මම විඳින දුක් ගැන මම ප්‍රීති වෙමි. මාගේ ඒ ශාරීරික දුක් විඳීම හේතු කොටගෙන ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය වන සභාව උදෙසා ඔවුන් වහන්සේගේ දුක්විඳීමේ ඌනතා සම්පූර්ණ කිරීමට මම සහාය වෙමි. මේ සභාවේ සේවකයකු වශයෙන් දෙවියන් වහන්සේ මා පත්කර, ඔබේ යහපත උදෙසා මට වගකීමක් භාර දුන් සේක. ඒ වගකීම නම් දෙවියන් වහන්සේගේ පණිවුඩය සම්පූර්ණයෙන් ප්‍රකාශ කිරීමය. ඒ පණිවුඩය යුග හා පරම්පරා ගණනාවක් තිස්සේ රහසක්ව සැඟවී තිබී , දැන් එය සැදැහැවතුන් හට අනාවරණය කර ඇත. ...... ඒ රහස නම්, ක්‍රිස්තුන් වහන්සේ ඔබ තුළ වැඩ විසීමය. "**

04. වචනයේ සේවකයා සඳහා :

* ශුද්ධාත්මයාණන් කරණ කොට ගෙන, ශු.පාවුළු තුමා විශ්වාසාලෝකය තුළින් අත්දුටු අනාවරණය පිළිබඳව අපි කථා කළෙමු. සරල උදාහරණයන් තුළින් අපි එම මහඟු තිළිණය කුමක්දැයි අවබෝධ කර ගතිමු.

* එකම වස්තුවක් විවිධ එළියෙන් දැකගත හැකිය. කණාමැදිරි එළියක් මගින් යම් තරමකට දැක ගැනීමට පුළුවන. ඉටිපන්දම් එළියකින් ඊට වඩා පැහැදිලිව දැක ගැනිමට පුළුවන. බලවත් වූ ආලෝක ධාරාවකින් ඊටත් වඩා පැහැදිලිව දැක ගැනීමට පුළුවන. එසේම පරම සත්‍යය වන සමිඳාණන් වහන්සේව දකිමින්, යථාර්ථය අවබෝධ කර ගැනීමට ඉතාම බලගතු ආලෝකය වන්නේ විශ්වාසාලෝකයයි.

* එබැවින් ජීවිතය, මරණය මෙන්ම දුක් වේදනා, පීඩාවන් ආදි සියල්ල දෙස අළුත් පිළිවෙලට බැලීම යනු .... අපට ලැබී තිබෙන විශ්වාසාලෝකය නමැති මහඟු තිළිණයේ තිළිණයකි.

05. අවසාන යැදුම:

* විශ්වාසාලෝකය නමැති මහඟු තිළිණයට මග හෙළිකරන මෙම ත්‍යාගය ගැඹුරු ලෙස වැඩි වර්ධනය කරනු සඳහා ශුද්ධාත්ම ස්නපනය පතා අපි යාච්ඤා කරමු.
* ගලාති 2:20 සඳහන් කිතුනු සත්‍යය අයිති කර ගනිමු. "දැන් මා නොව, ක්‍රිස්තුන් වහන්සේ මා තුළ ජීවත් වන සේකැ"යි ගායනා කරමු. අත්දකින්නට පටන් ගනිමු.

*******************